ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය: PS/EPC/Circular06/2020

2020 ජනවාරි මස 24 වන දින

ලේකම්, මුදල්, ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ලේකම්, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
ලේකම්, අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතා හා පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශය
ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සභාපති, වී අලෙවි මණ්ඩලය

**2019/20 මහ කන්නයේ වී අස්වනු මිලදී ගැනීමේ කඩිනම් වැඩපිලිවෙළ**

2019/20 මහ කන්නය සඳහා වී අස්වනු මිලදී ගැනීම හා වී ගොවීන් සඳහා රජයේ සහතික මිල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී, ප්‍රමිතියෙන් යුතු වී කිලෝ ග්‍රෑම් එකකට රු. 50.00 ක අවම මිලක් ලබාදීමට රජය තීරණය කර ඇත. ඒ අනුව, රජයේ වී මිලදී ගැනීමේ ප්‍රතිපත්තිය ප්‍රකාරව මෙම කන්නයේ වී මිලදී ගැනීමේ කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අතිගරු ජනාධිපතිතුමා සහ අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් දී ඇත. මෙම වැඩසටහන, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ හා අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතා හා පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශයේ සහාය ඇතිව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් වී අලෙවි මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ඇත. ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවද වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය ඉතා කඩිනමින් ක්‍රියාත්මක කිරිමට දායක වනු ඇත. ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සමෘද්ධි බැංකුව හා සමුපකාර බැංකු මෙම වී මිලදී ගැනීමේ ප්‍රධාන මූල්‍ය සැපයුම්කරුවන් වශයෙන් කටයුතු කරනු ලැබේ.

02) වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය තුළ තොග භාර ගැනීම, ගබඩා කිරීම සහ ඊට අදාළ ලේඛණ පවත්වා ගැනීම හා ගිණුම් ගත කිරීම පිළිබඳ වගකීම වී අලෙවි මණ්ඩලයේ නිලධාරීන් හා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරේ. එම නිලධාරීන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පහත දක්වා ඇති උපදෙස් අනුගමනය කල යුතු බව දන්වා සිටිමි.

2.1) 2019/20 මහ කන්නයේ වී මිලදී ගැනීමේ සහතික මිල

වී මිලදී ගන්නා ස්ථාන වෙත රැගෙන එන වී තොග වල උපරිම තෙතමනය 14% ක් සහ උපරිම බොල් ප්‍රමාණය 9% ක් වන නිසි ප්‍රමිතියෙන් යුතු විය යුතුය. එම ප්‍රමිතියට අඩු, තෙතමනය 14% ඉක්මවන 22% ට අඩු වී තොග වෙනම හඳුනාගත යුතුය. මෙම ප්‍රමිතීන්ට අදාලව ඉදිරිපත් වන වී තොග පහත මිල ගණන් යටතේ මිලට ගත යුතුය.

I) නිසි ප්‍රමිතියෙන් යුතු වී කිලෝ ග්‍රෑම් 01 ක් - රු. 50.00
II) තෙතමනය14% ඉක්මවන 22% ට අඩු වී කිලෝ ග්‍රෑම් 01 ක් - රු. 44.00



ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපෑල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

2.2) ඉහත මිල ගණන්වලට අදාලව පහත සඳහන් ක්‍රමවේදයන් යටතේ වී මිලදී ගැනීම ක්‍රියාත්මක කෙරේ.

I) වී අලෙවි මණ්ඩලය විසින් ප්‍රමිතියෙන් යුතු වී මිලදී ගැනීම

ප්‍රමිතියෙන් යුතු වී කිලෝ ග්‍රෑම් එකක් රු. 50.00 ක අවම මිලක් යටතේ වී අළෙවි මණ්ඩලය මඟින් මිලදී ගනු ලැබේ. මිලදී ගන්නා වී තොග සඳහා අදාළ ගොවියා නමින් වටිනාකම සඳහන් ගෙවීමේ සහතික පතක් වී අළෙවි මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබේ. එම ගෙවීම් සහතික පත්‍රය, වී අළෙවි මණ්ඩලයේ සභාපති විසින් බලය පවරනු ලබන නිලධාරියෙක් සහ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් බලය පවරනු ලබන නිලධාරියෙක් ලෙස නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කළ යුතුය.

එම ගෙවීමේ සහතික පත්‍රය, ලංකා බැංකුව, මහජන බැංකුව හෝ ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ අදාල ශාඛාවට ඉදිරිපත් කළ යුතු අතර අදාල බැංකුව විසින් නියමිත මුදල ගොවියාගේ බැංකු ගිණුමට වහාම බැර කරනු ලැබේ.

II) ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ සමුපකාර සමිති හරහා ප්‍රමිතියෙන් යුතු වී වලට අමතරව තෙතමනය 14% ඉක්මවා ඇති හා 22% ට අඩු තත්ත්වයේ වී මිලදී ගැනීම.

ප්‍රමිතියෙන් යුතු වී කිලෝ ග්‍රෑම් එකකට රු. 50.00 බැගින් ද, තෙතමනය 14% ඉක්මවා ඇති හා 22% ට අඩු තත්ත්වයේ පවතින වී කිලෝ ග්‍රෑම් එකකට රු. 44.00 බැගින් ද, වී තොග ප්‍රාදේශිය ලේකම්වරුන් මඟින් කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ සමුපකාර සමිති හරහා මිලදී ගනු ලැබේ. එසේ මිලදී ගැනීමේ කටයුතු නීත්‍යානුකූලව සිදුකිරීම සඳහා, භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද මේ සමඟ අමුණා ඇති (ඇමුණුම 01) ආකෘතිය අනුව විධිමත් ගිවිසුමකට එළඹිය යුතුය.

මිලදී ගන්නා වී තොග සඳහා අදාළ ගොවියා නමින් වටිනාකම සඳහන් ගෙවීමේ සහතික පත්‍රයක් ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. එම ගෙවීමේ සහතික පත්‍රය කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියා සහ දිස්ත්‍රික් ලේකම්වරයා/ප්‍රාදේශීය ලේකම්වරයා විසින් බලය පවරනු ලබන නිලධාරියෙක් ලෙස නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කළ යුතුය.

එම ගෙවීමේ සහතික පත්‍රය, ලංකා බැංකුව, මහජන බැංකුව හෝ ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ අදාල ශාඛාවට ඉදිරිපත් කළ යුතුය. අදාල බැංකුව විසින් ගොවියාගේ බැංකු ගිණුමට නියමිත මුදල වහාම බැර කරනු ලැබේ.

නියමිත ප්‍රමිතියට අනුකූල නොවන නමුත් කිලෝ ග්‍රෑම් එකක් රු.44.00 ට මිලදී ගන්නා වී නියමිත ප්‍රමිතියට වියළා ගැනීමට පෞද්ගලික කුඩා හා මධ්‍ය පරිමාණ වී මොල් හිමියන් දායක කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශිය ලේකම් විසින් කටයුතු කළ යුතුය. මෙහිදී, වී වියළීම සඳහා වැයවන වියදම වී කිලෝ ග්‍රෑම් එකකට රු. 4.00 ක උපරිම මුදලකට යටත්ව පෞද්ගලික වී මෝල් හිමියා වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

03) වී මිලදී ගන්නා ප්‍රදේශවල පිහිටුවා ඇති මෙම වැඩසටහන සඳහා ප්‍රධාන මූල්‍ය සැපයුම්කරුවන් වශයෙන් කටයුතු කරන බැංකුවලට අයත් ශාඛා, දිස්ත්‍රික් ලේකම්වරයාගේ සේවා අවශ්‍යතාවය මත සති අන්තවලද විවෘත කර තැබිය යුතුය.

04) එක් ගොවියෙකුගෙන් වගා කර ඇති භූමි ප්‍රමාණය අනුව මිලදී ගත හැකි වී ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| වගා කර ඇති බිම් ප්‍රමාණය | මිලදී ගන්නා උපරිම වී ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) |
|---|---|
| අක්කර 1 දක්වා | 1,000 |
| අක්කර 1 – 3 දක්වා | 3,000 |
| අක්කර 3–5 දක්වා | 5,000 |

05) මිලදී ගනු ලබන වී තොග නිසි පරිදි ගබඩා කර තබා ගැනීම සඳහා ආහාර කොමසාරිස්වරයා සතු සියළුම ගබඩා වී අළෙවි මණ්ඩලයට හෝ දිස්ත්‍රික් ලේකම්වරුන්ට පැවරීමට කටයුතු කළ යුතුය. ප්‍රදේශයේ ඇති භාවිතයට නොගෙන ඇති වෙනත් ගොඩනැගිලි ද අවශ්‍යවන පරිදි යොදා ගැනීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට බලය පැවරේ. ගබඩාකරණයේ අවශ්‍යතාවය සළකා ඒ සඳහා සුදුසු වන බහාලුම් (කන්ටේනර්) යොදාගැනීම වැනි ක්ෂණික විසඳුම් ක්‍රම ගැළපෙන පරිදි යොදා ගැනීමට කටයුතු කළ යුතුය. ගබඩා වලට අවශ්‍ය ආරක්ෂක කටයුතු දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිර්දේශ මත ත්‍රිවිධ හමුදාව විසින් සපයනු ඇත. මෙම කටයුතු සඳහා දිස්ත්‍රික් ලේකම්වරයාගේ අවශ්‍යතාවය මත සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ද යොදවාගත හැකිය.

06) මෙම වැඩසටහන සඳහා අවශ්‍යවන ඇසුරුම් මළු, තෙතමන මැණුම් මාපක සහ තරාදි වැනි මූලික අවශ්‍යතා අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් සහ වී අළෙවි මණ්ඩලය විසින් සැපයිය යුතුය. මේ සම්බන්ධව අවශ්‍යවන ප්‍රවාහන කටයුතු සඳහා රජ්‍ය ආයතන සතුව පවතින ලොරි සහ ට්‍රක් රථ අවශ්‍යතාවය මත යොදා ගැනීමට කටයුතු කල යුතුය.

07) මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරිම ජාතික ප්‍රමුඛතාවයක් සේ සළකා සමස්ථ රාජ්‍ය සේවයම අස්වනු නෙළන කාලය තුළ කැපවීමෙන් ආදර්ශමත්ව කටයුතු කළ යුතු බව අතිගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් දී ඇත. මෙම කටයුතු සාක්ෂාත් කරගැනීම සඳහා වැඩිමනත් උපදෙස් අවශ්‍ය වන්නේ නම්, ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හෝ ලේකම්- මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය හෝ ලේකම්- මුදල්, ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය, සභාපති- වී අළෙවි මණ්ඩලය හෝ අධ්‍යක්ෂ ජනරාල් (ආර්ථික ප්‍රතිපත්ති සහ සංවර්ධන සම්බන්ධීකරණ) - ජනාධිපති කාර්යාලය ඇමතිය හැකිය.

පී.බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්

පිටපත්

01. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
02. යුද්ධ හමුදාපති, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
03. නාවික හමුදාපති, ශ්‍රී ලංකා නාවික හමුදාව
04. ගුවන් හමුදාපති, ශ්‍රී ලංකා ගුවන් හමුදාව
05. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
06. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

} - කරු.අ.ක.ස

07. අධ්‍යක්ෂ ජනරාල්, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
08. සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
09. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
10. ආහාර කොමසාරිස්, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
11. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්
12. සභාපති, ලංකා බැංකුව
13. සභාපති, මහජන බැංකුව
14. සභාපති, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
15. සභාපති, සමූපකාර තොග වෙළඳ සංස්ථාව

\- කරු.දැ.ගැස

ඇමුණුම 1

**වී කොටා සහල් කර සතොස ආයතනය වෙත ලබා දීමේ ගිවිසුම් පත්‍රයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ........................පරිපාලන දිස්ත්‍රික්කයේ.................දරණ ස්ථානයේ ප්‍රධාන කාර්යාලය ලෙස පවතින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිසාපති ..........................................හෝ ඔහුගේ නිල අනුප්‍රාප්තිකයෝ ද ඇතුලත්වන පළමු පාර්ශවයද..................................පරිපාලන දිස්ත්‍රික්කයේ ..........................ලිපිනයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන ........................................(සහල් මෝලේ නම) ....................................(සහල් මෝල් හිමිකරුගේ නම) (ජා. හැ. අංක..........................) ට හෝ එකී මොල් හිමිකරුට අයත් උරුමක්කරුවෝද, පොල්ම:කරුවෝද , අද්මිනිස්ත්‍රාතිකාරයෝද, නිල අනුප්‍රාප්තිකයෝ ද ඇතුලත් වන දෙවෙන පාර්ශවය ද 2019/20 මහ කන්නයේ රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන යටතේ මිලදී ගෙන දැනට පළමු පාර්ශවය භාරයේ පවතින වී තොග කොටා සහල් බවට පත්කර ලංකා සතොස ආයතනය වෙත විකිණීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් මතු දැක්වෙන වගන්ති ප්‍රකාර කටයුතු කිරීමට ගිවිසගෙන පහත අත්සන් තබා ඇතිකර ගන්නා වූ ගිවිසුමයි.

01. පළමු පාර්ශවය විසින් 2019/20 මහ කන්නයේදී මිලදී ගත් වී තොග , පළමු පාර්ශවයේ අවශ්‍යතාවය පරිදි, වී කොටා සහල් බවට පත් කර, ලංකා සතොස ආයතනය වෙත ලබා දීමේ පදනම මත තීරණය කරණු ලබන වී තොග දෙවන පාර්ශවය වෙත ලබා දීමට පළමු පාර්ශවය එකඟවේ.

02. දෙවන පාර්ශවය විසින් ඉතා උසස් තත්වයෙන් එම වී තොග කොටා සකස් කල සහල් තම මෝලේ සිට මෝලට ආසන්නම ලංකා සතොස ආයතනයේ ගබඩාව වන (වීරවිල / වැලිසර / එඬේරමුල්ල) වෙත විධිමත් පරිදි භාර දිය යුතුවේ.

03. කොටා පිරිසිදු කරන ලද එම සහල් වල ප්‍රමිතිය පහත සඳහන් පරිදි වීමට දෙවන පාර්ශවය වගබලා ගත යුතුය

(අ).සහල් මනුෂ්‍ය පාරිභෝජනය සඳහා සුදුසු හොද තත්වයේ ඒවා විය යුතු අතර කිසිම දුර්ගන්ධයකින් තොර අළුත් සහල් විය යුතුය.

(ආ). සහල් සම්පූර්ණයෙන්ම කෘමීන්ගෙන් සහ කෘමි උවදුරු වලින් තොර විය යුතුය.

04. නිකුත් කල වී වලින් සහල් කිරීමේ ප්‍රතිශතය කීරි සම්බා සඳහා 60% ක්ද අනෙකුත් වර්ග සඳහා 65%ක් සේ සලකා අදාල සහල් ප්‍රමාණය ගනණය කර ලංකා සතොස ආයතනයේ ඉහත 02 යටතේ දක්වා ඇති ආසන්නතම ගබඩා වෙත භාර දීමට දෙවන පාර්ශවකරු එකඟ වේ.

05. දෙවන පාර්ශවය විසින් සකස් කළ සහල් ලංකා සතොස ආයතනය වෙත භාර දීමට පෙර පළමු පාර්ශවයෙන් පූර්ව අනුමැතියක් ලබා ගත යුතු අතර එම සහල් ලංකා සතොස ආයතනයට බාරදීමෙන් පසු ලබාගත් කුවිතාන්සිය(GRN) පළමු පාර්ශවය වෙත ඉදිරිපත් කල පසු එම පලමු පාර්ශවය, දෙවන පාර්ශවය වෙත ලබා දුන් වී වලට අදාලව කෙටුම් කුලිය, ප්‍රවාහන ගාස්තු හා අනෙකුත් දරණ ලද වියදම් තහවුරු කර ගැනීමකින් පසුව පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය වෙත අදාල මුදල් ගෙවනු ලැබේ. සහල් ප්‍රවාහනය සඳහා යන වියදම් අවම කර ගැනීම සඳහා විශාල තොග එක විට ප්‍රවාහනය කල යුතුය. ඒ අනුව, වී කෙටීම, ප්‍රවාහනය

හා අනෙකුත් මෙහෙයුම් වියදම් හා සහල් ප්‍රවාහනය සඳහා දෙවන පාර්ශවය වෙත පහත පරිදි ගෙවීම් කිරිමට පළමු පාර්ශවය කටයුතු කරනු ඇත.

(අ)

| වර්ගය | වී කෙටීම, වී ප්‍රවාහනය හා අනෙකුත් මෙහෙයුම් වියදම් (කි.ග්‍රෑ 1 ක් සඳහා උපරිමය) රු. |
|---|---|
| කීරි සම්බා | 8.00 |
| සම්බා සුදු හා රතු | 6.40 |
| නාඩු සුදු | 6.40 |
| නාඩු රතු | 5.60 |
| රතු කැකුළු | 4.50 |

(ආ) සහල් මෙ.ටො. 1ක්, කි.මී.1ක් ප්‍රවාහනය කිරිම සඳහා උපරිමය රු.7.00 ක් ගෙවීමට කටයුතු කෙරේ.

ලංකා සතොස ආයතනය වෙත සහල් ලබා දීමෙන් ලැබෙන ආදායම තුල කළමනාකරණය කර ගැනීමට යටත්ව, ඉහත (5).(අ). හා (5).(ආ). යටතේ ඇති උපරිම මිල වෙනස් කිරිමට දිස්ත්‍රික් ලේකම් වරයාට හැකිය.

06. දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය තමා වෙත ලබා දුන් වී තොග වලින් ලබා ගත් සහල් පමණක්ම ලංකා සතොස ආයතනය වෙත ලබා දෙන බවට තරයේ වගබලා ගත යුතුය. එසේම පළමු පාර්ශවය විසින් ලබා දුන් වී තොග සහ සකස් කරන ලද සහල් තොග තම මෝලෙහි සකස් කර ඇති සහ ගබඩා කර ඇති අනෙකුත් සහල් හා වී තොග වලින් වෙන් කර ගබඩා කර ගත යුතුය. මෙම ක්‍රියාවලිය පළමු පාර්ශවය විසින් බලය පවරන නිලධාරියෙකු විසින් අධීක්ෂණය කරනු ඇත. එසේම සහල් සකස් කිරිමේ ක්‍රියාවලිය සිදු වන අවස්ථාවේදි පළමු පාර්ශවය විසින් බලය පවරන නිලධාරින් පැමිණ පරික්ෂා කරනු ලැබේ. මේ සඳහා දෙවන පාර්ශවයේ සහයෝගය ලබා දිය යුතුය.

07. සහල් සකස් කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය සෞඛ්‍යට හිතකර වන අන්දමින් අනිවාර්යෙන්ම සිදුවිය යුතුය.

08. ගිවිසුම අත්සන් කිරීමෙන් පැය 24ක් ඇතුලත පලමු වී තොගය පළමු පාර්ශවය වෙතින් ලබා ගැනීමට දෙවන පාර්ශවය කටයුතු කල යුතු අතර, ඒ සඳහා වී නිකුත් කිරීමේ පහසුකම් සැපයීමට පළමු පාර්ශවය බැදී ඇත. නිකුත් කරන වී තොගයේ ප්‍රමාණය පාර්ශව දෙකේ එකගතාවය මත තීරණය කළ යුතුය.

09. වී සහල් කිරිම ආරම්භයේදි අදාල එක් එක් වී තොග වලින් ලබා ගත් සාම්පලයක් හා සහල් කළ පසු ලබා ගත් සාම්පලයක් පළමු පාර්ශවය විසින් බලය පවරන නිලධාරියෙකු වෙත දෙවන පාර්ශවය විසින් ලබා දිය යුතු වේ. ලංකා සතොස ආයතනය වෙත දෙවන පාර්ශවකරු විසින් භාර දුන් සහල් වල ගුණාත්මකභාවය පිළිබඳව යම් ගැටළුවක් මතුවුවහොත් මුලින් ලබා ගත් වී සාම්පල් හා අදාල සහල් සාම්පල් සමග සැසඳීමෙන් ගුණාත්මකභාවය පරික්ෂා කිරිමට දෙපාර්ශවය එකඟ වේ.

10. යම් අවස්ථාවක ලංකා සතොස වෙත ලබා දුන් සහල් වල ගුණාත්මකභාවය 03 වන වගන්තියේ දක්වා ඇති පරිදි අපේක්ෂිත මට්ටමට නොමැති බව තහවුරු වුවහොත් හෝ සාම්පල් වලට වඩා වෙනස් වී ඇත්නම් වී තොග වලට අදාලව 05 වගන්තිය යටතේ දක්වා ඇති කිසිදු මුදලක් දෙවන පාර්ශවය වෙත නොගෙවීමට පළමු පාර්ශවයට බලය ඇත.

11. තමාගේ මෝලේ වී කෙටීමේ ධාරිතාවය සලකා බලා අවශ්‍ය වී තොග පමණක් පළමු පාර්ශවය වෙතින් ලබා ගැනිමේ වගකීම දෙවන පාර්ශවය සතු වේ. පළමු පාර්ශවය වෙතින් වී තොග ලබා ගත් පසු දෙවන පාර්ශවය විසින් සකස් කරන ලද තැම්බූ සහල්, වී තොගය ලබා ගත් දින සිට දින 3ක් ඇතුලත ද කැකුළු සහල් දින 2ක් ඇතුලත ද ලංකා සතොස ආයතනය වෙත භාර දීමේ ක්‍රියාවලිය ආරම්භ කල යුතුය.

12. වී කෙටීම හා ලංකා සතොස ආයතනය වෙත සහල් ප්‍රවාහනය කර බාරදීමේ වගකීම දෙවන පාර්ශවය සතු වේ.

13. දෙවන පාර්ශවය විසින් මෙම ගිවිසුම යටතේ පළමු වන පාර්ශවයෙන් ලබා ගන්නා වී තොග සහ එම වී තොග යොදාගෙන නිෂ්පාදනය කරනු ලබන සහල් තොග 1982 අංක 12 දරණ පොදු දේපල පනත යටතේ පොදු දේපලක් වේ.

14. මෙම ක්‍රියවලියේදී දෙවන පාර්ශවය විසින් මෙම ගිවිසුමේ කොන්දේසි කඩකලහොත් පළමු පාර්ශවයට විසින් 1982 අංක 12 දරණ පොදු දේපල පනත යටතේ හෝ ශ්‍රී ලංකාවේ බල පවත්නා වෙනත් නීතියක් යටතේ නිතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

15. දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවයෙන් ලබා ගන්නා වී තොග සඳහා අදාල සහල් තොග ලංකා සතොස ආයතනය වෙත භාර දී අවසන් වනතෙක් හා එසේ ලබා දුන් සහල් තොග සඳහා පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවයට අදාල මුදල් ගෙවීම අවසන් වනතෙක් මෙම ගිවිසුම වලංගු වේ.

16.

මෙම ගිවිසුමේ පාර්ශව කරුවන් විසින් ඉහත සඳහන් ප්‍රකාර ගිවිස ගැනීමට ස්වකීය අත්සන තබන්නට යෙදුනා ඇත.

වර්ෂ ........ක් වූ ........... මස..............වන දින .................................. පළමු පාර්ශවය කාර්යාලයේදි අත්සන් කරන ලදි.

...................................... ..................................

පළමු පාර්ශවය (දිසාපති හෝ ඔහුගේ නියෝජිත) මෝල් හිමිකරු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නම-............................

........................................... ලිපිනය-.......................

**සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට සාක්ෂි :-**

පළමු පාර්ශවය/දිසාපති

01.නම -............................................

ජා.හැ.ප.අංකය - ..................................

ලිපිනය - .............................................

.............................................

.............................................

අත්සන - .............................................

02. නම -..................................................

ජා.හැ.ප.අංකය - ..................................

ලිපිනය - .............................................

.............................................

.............................................

අත්සන - .............................................

මොල් හිමිකරු

01. නම - ..................................................

ජා.හැ.ප.අංකය - ..................................

ලිපිනය - .............................................

.............................................

.............................................

අත්සන - .............................................

02. නම - .................................................

ජා.හැ.ප.අංකය - ..................................

ලිපිනය - .............................................

.............................................

.............................................

අත්සන - .............................................